**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය**

# ලංසු කැඳවීම

01. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ (මධ්‍යම පළාත) සභාපති විසින්, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන කාර්යයන් සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකමලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. කොන්ත්‍රාත්තුවේ විස්තර

| අනු අංකය | කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත්තුවේ නම | ඉංජිනේරු ඇස්තමේන්තුව (අවිනිශ්චිත වියදම් හා 20% ලාබාංශ රහිතව) (රුපියල් මිලියන) | ලංසු ආරක්ෂණය (රුපියල්) | කොන්ත්‍රාත් කාලය (කැලැන්ඩර දින) | CIDA ශ්‍රේණිය | ආපසු නොගෙවන ලේඛණ ගාස්තුව (බදු රහිතව) (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 01 | RDA/CP/PD/ 2024/48 | පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි (ඒ 5) මාර්ගයේ බෝක්කු අංක 9/5-9/6 (දකුණු පස) අතර කොන්ක්‍රීට් රැඳවුම් බැම්මක් ඉදිකිරීම | 7.5 | 135,000.00 | 119 | C6, C7 මහා මාර්ග | 4,500.00 |
| 02 | RDA/CP/PD/ 2024/49 | මාතලේ-ඉලුක්කුඹුර-ලග්ගල (බී 274) මාර්ගයේ කි.මී 9+480 - 9+990 අතර කොන්ක්‍රීට් කාණු පද්ධතිය ඉදිකිරීම. | 13.3 | 240,000.00 | 161 | C5, C6 මහා මාර්ග | 6,300.00 |
| 03 | RDA/CP/PD/ 2024/50 | මහනුවර-මහියංගනය-පදියතලාව ( ඒ-26) මාර්ගයේ බෝක්කු අංක 19/2 අළුත්වැඩියා කිරීම | 11.28 | 204,000.00 | 147 | C5, C6 මහා මාර්ග | 5,700.00 |
| 04 | RDA/CP/PD/ 2024/51 | මහනුවර-මහියංගනය-පදියතලාව ( ඒ-26) මාර්ගයේ දිගන නගරයේ කි.මී 14+500 (දකුණුපස/වම්පස) පුළුල් කර වැඩිදියුණු කිරීම | 8.2 | 148,000.00 | 126 | C6, C7 මහා මාර්ග | 4,700.00 |
| 05 | RDA/CP/PD/ 2024/52 | පේරාදෙණිය - හල්ඔලුව-කටුගස්තොට මාර්ගයේ පේරාදෙණිය හන්දිය පුළුල් කර වැඩිදියුණු කිරීම | 5.3 | 96,000.00 | 91 | C6, C7 මහා මාර්ග | 3,900.00 |

03. මෙම ප්‍රසම්පාදනය ජාතික තරගකාරී ලංසු තැබීම (NCB) හරහා සිදු කෙරේ. මෙම ප්‍රසම්පාදනය යටතේ (වැට් බදු සහ අනෙකුත් බදු හැර) සිදුකිරීමට නියමිත වැඩවල ඇස්තමේන්තු වටිනාකම රු.මි. 50 ට අඩු බැවින් රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛණයේ අංක 04/2016 (iii) හි කලාපීය මනාපය සහ CIDA ශ්‍රේණියේ මනාපය සලකනු ලැබේ.

04. ලංසුව. ඉහත වගුවෙහි දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතු අතර **2024.09.08** දින දක්වා **එකී ලංසු ආරක්ෂණය වලංගු විය යුතුය.** ලංසු ආරක්පණයක් නොමැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. මේ සම්බන්ධව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.06.07** දින සිට පහත සඳහන් කාර්යාල වලින් ලංසු ලේඛණ පරික්ෂා කිරීම සිදු කළ හැකි අතර **2024.06.07** වන දින සිට **2024.06.24** දක්වා 9.00 පැය සිට 15.00 පැය අතර කාලයේදී පහත සඳහන් කාර්යාල වලින් වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.

- පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය(ම.ප), මාර්ග සංවර්ධන අධිකාරිය, අස්ගිරිය,. මහනුවර.
  දු.ක. අංකය - 0812-226150 ෆැක්ස් - 0812-237931 විද්‍යුත් තැපැල් - pdcentral123@gmail.com
  0812-232119

06. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් මහනුවර අස්ගිරියෙහි පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් භාර අධ්‍යක්ෂ (ම.ප) කාර්යාලයෙන් ලංසු ලේඛණ කාර්යාලීය වේලාව තුලදී කිසිදු ගාස්තුවකින් තොරව පරීක්ෂා කිරිම කල හැකි අතර **2024.06.07** දින සිට **2024.06.24** දින දක්වා 9.00 පැය සිට 15.00 පැය කාලය තුල ආපසු නොගෙවනු ලබන ලේඛණ ගාස්තු ගෙවීම් කරන ලද (බදු රහිතව) රිසිට්පතද සමග ලිඛිත අයදුම්පතක් යොමු කිරීමෙන් සම්පූර්ණ අයදුම්පත් කට්ටලයක් පළාත්භාර අධ්‍යක්ෂ (ම.ප) කාර්යාලය වෙතින් ලබා ගත හැකිය.

07. 1987 අංක 3 දරන පොදු පනත අනුව මිලියන 5 ට වැඩි ලංසු සඳහා ලංසුකරුවන් සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවේ සහතිකය සමග ලංසු ඉදිරිපත් කළ යුතුය.

08. සම්පූර්ණ කල ලංසු පිටපත් දෙකකින් යුක්තව ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ අදාල කොන්ත්‍රාත්තුව සහ අංකය සඳහන් කර සභාපති. ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව. මාර්ග සංවර්ධන අධිකාරිය. තැ.පෙ.100, අස්ගිරිය. මහනුවර යන ලිපිනයට **2024.06.25** දින **14.00** පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද ලංසු විවෘත කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එදින **14.30** පැයට ලංසුකරුවන් හෝ ඔවුන් විසින් තෝරා එවූ නියෝජිතයන් ඉදිරියේ එකී ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති.**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව(මධ්‍යම පළාත)**
**පළාත්භාර අධ්‍යක්ෂ(ම.ප) කාර්යාලය.**
**මාර්ග සංවර්ධන අධිකාරිය.**
**තැ.පෙ.100, අස්ගිරිය. මහනුවර**